Australian Government

COVID-19 VACCINATION

# කෝවිඩ්-19 එන්නත සඳහා සූදානම්වීම

අවසාන යාවත්කාලීන කිරීම: 2021 ජූලි 30

## ඔබගේ තොරතුරු නිවැරදි බවට වග බලා ගන්න

ඔබගේ හමුවීම සඳහා බලා සිටින අතර ඒ සඳහා සූදානම්වීමට කල හැකි දේ ඇත.

ඔබට සුදුසුකම් ඇතිනම්, ඔබගේ තොරතුරු මෙඩිකෙයාර් සමඟ යාවත්කාලීන බවට වග බලා ගන්න (ඔබට මෙඩිකෙයාර් සඳහා සුදුසුකම් නොමැති වුවද, ඔබට කෝවිඩ්-19 එන්නත ලබා ගත හැකිය). මෙය පහත ආකාරයට කල හැකිය:

- myGov ඔස්සේ Medicare online account මගින්
- Express Plus Medicare app මගින්.
- Medicare program ඇමතීම මගින්.

ඔබගේ ගිණුම ආරම්භ කර නැතිනම්:

- ඔබ දැනටමත් මෙඩිකෙයාර් සඳහා ඇතුලත්වී නොමැතිනම්, මෙඩිකෙයාර් සඳහා ඇතුලත්වන්න.
- ඔබ මෙඩිකෙයාර් සඳහා ඇතුලත්වී ඇති අතර ඔබගේ මෙඩිකෙයාර් ගිණුම සමඟ myGov සම්බන්ධ කර නැතිනම්, ඔබගේ මාර්ගස්ථ මෙඩිකෙයාර් ගිණුම ආරම්භ කරන්න.
- ඔබ මෙඩිකෙයාර් සඳහා සුදුසුකම් නොලබයි නම්, Individual Health Identifier (IHI) ලබා ගන්න.

ඔබගේ එන්නත ලබා ගත් පසු, ඔබගේ එන්නත් තත්වය ඔප්පු කිරීම සඳහා ප්‍රතිශක්තිකරණ ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශනයක් ලබාගත හැකිවේ. සර්විසස් ඕස්ට්‍රේලියා වෙබ් අඩවිය ඔස්සේ ඔබගේ ප්‍රතිශක්තිකරණ ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශනය ලබා ගන්නා ආකාරය සොයා ගත හැකිය.

## ඔබගේ හමුවට සූදානම්වීම

ඕස්ට්‍රේලියාව තුල සහ ගෝලීය වශයෙන් කෝවිඩ්-19 එන්නත ඇත්තේ සීමාසහිත වශයෙනි. මෙයින් අදහස් වන්නේ දරුණු කෝවිඩ්-19 ආසාදනය සම්බන්ධ ඉහළ අවදානමක් ඇති සහ/හෝ වයිරසය සම්බන්ධ වැඩි නිරාවරණයක් ඇති අය හට එන්නත ප්‍රථමයෙන් ලබාදෙන බවයි. අනෙක් අයට එන්නත ලැබෙන්නේ ඉන් පසුවය. www.health.gov.au/covid19-vaccines වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් එන්නත සඳහා ප්‍රමුඛත්වය ලැබෙන අය සොයා ගත හැකිය. ඔබට කෝවිඩ්-19 එන්නත ලබා ගැනීම සඳහා හමුවීමක් පිළියෙල කර ගත හැකිද යන්න https://covid-vaccine.healthdirect.gov.au/ යන වෙබ් අඩවිය වෙත පිවිසී බලා ගත හැක.

ඔබ පහත අයෙකු නම්, කෝවිඩ්-19 එන්නත් හමුවකට යා යුතු නොවේ:

- උණ, කැස්ස, සොටු ගැලීම හෝ කෝවිඩ්-19 හේතුවෙන් ඇතිවිය හැකි වෙනත් රෝග ලක්ෂණ සහිතව අසනීපයෙන් සිටීනම්
- කෝවිඩ්-19 පරීක්ෂණ ප්‍රතිඵල බලාගෙන සිටීනම්
- කෝවිඩ්-19 ආසාදිත බවට පරීක්ෂණයකින් තහවුරු වී ඇති අතර හුදෙකලාවී සිටීනම්
- නිරෝධායනයවී සිටී නම්
- කෝවිඩ්-19 ආසාදිතයෙකු හා සමීප සම්බන්ධවූ අයෙකු නම්.

ඔබ ඉහත කාණ්ඩයකට අයත්වේ නම්, ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන්නා සමඟ පරීක්‍ෂා කර බලන්න. ඔබට එන්නත ලබා ගැනීම සඳහා ඇති හමුව නැවත යොදා ගත යුතුව ඇත. කෝවිඩ්-19 ආසාදනයට ප්‍රතිකාර කිරීම සඳහා කෝවිඩ්-19 එන්නත ඵලදායී නොවේ.

ඔබගේ කෝවිඩ්-19 එන්නත ලබාදීම සඳහාවූ හමුවට දින 7 කට පෙර ඔබට වෙනත් එන්නතක් ලබාදුණි නම්, ඔබගේ ප්‍රතිශක්තිකරණ ලබා දෙන අය හට ඒ බව දන්වන්න. ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන්නා විසින් ඔබට අළුත් දිනයක් ලබා දෙනු ඇත.

ඔබට උණ හෝ වෙනත් ශ්වසන රෝග ලක්‍ෂණ නොමැතිනම්, එන්නත ලබා ගැනීමට පෙර කෝවිඩ්-19 පරීක්‍ෂණයක් කරවා ගැනීම අවශ්‍ය නැත.

## මාත්‍රා දෙකක් ලබා ගැනීම සඳහා කල් ඇතිව සැලසුම් කරන්න

ඔබ විසින් කෝවිඩ්-19 එන්නත් මාත්‍රා දෙකක් ලබා ගැනීම වැදගත්වේ. ඔබ කෝවිඩ්-19 ෆයිසර් (කෝමිනාර්ටි) එන්නත ලබා ගන්නේ නම්, මාත්‍රා දෙක අතර අවම වශයෙන් සති තුනක කාලයක් තිබිය යුතුය. ඔබ කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නත ලබා ගන්නේ නම්, මාත්‍රා දෙක අතර අවම වශයෙන් සති 12 ක කාලයක් තිබිය යුතුය. මාත්‍රා දෙක අතර කාල අන්තරය සමහර අවස්ථානුගත කරුණු අනුව සති 12 සිට සති 4 කට නොඅඩු කාලයක් දක්වා අඩු කිරීම යෝග්‍ය විය හැකිය. ඔබගේ දෙවන මාත්‍රාවෙන් සතියක් හෝ දෙකක් යන තුරු කෝවිඩ්-19 ආසාදනයට එරෙහිව සම්පූර්ණ ආරක්‍ෂාව නොලැබේ.

## එන්නත් සඳහා හමුවේමේදී බලාපොරොත්තු විය හැකි දේ

ඔබගේ එන්නත් සඳහා හමුවීම සඳහා පහත දේ රැගෙන ආ යුතුය:

- ඔබ ළඟ ඇතිනම්, ඡායාරූප හැඳුනුම්පත
- ඔබට ඇතිනම්, මෙඩිකෙයාර් කාඩ්පත
- ඔබගේ රැකියාව හේතුවෙන් කෝවිඩ්-19 එන්නත ලබා ගන්නේ නම්, සේවක හැඳුනුම්පත.
- ඔබට ඇති රෝග තත්ව, අසාත්මිකතා, රුධිර වහණ රෝග හෝ ප්‍රතිශක්තිකරණය නැතිවීම (උදා. දුර්වලවූ ප්‍රතිශක්තිකරණ පද්ධතියක්)
- ඔබ ගනු ලබන බෙහෙත් සම්බන්ධ තොරතුරු
- කලින් ලබාගත් කෝවිඩ්-19 එන්නත සම්බන්ධ තොරතුරු (එන්නත් වර්ගය සහ ලබාගත් දිනය)
- අතීතයේදී කිසියම් එන්නතක් හේතුවෙන් ඇතිවූ ප්‍රතික්‍රියා සම්බන්ධ තොරතුරු
- ඔබගේ වර්තමාන පවුලේ වෛද්‍යවරයා සහ ඔබ හමුවන කිසියම් විශේෂඥ වෛද්‍යවරයෙකු සිටීනම් ඔවුන්ගේ නම්
- මුව ආවරණයක්(ඔබගේ ප්‍රාන්තය/ටෙරිටරිය මගින් පැළඳීම අවශ්‍ය නම්).

ඔබට කෝවිඩ්-19 එන්නත සම්බන්ධ කිසියම් ගැටළුවක් ඇතිනම්, ඔබගේ හමුවේදී ප්‍රතිශක්තිකරණ සපයන්නා සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කල හැකිය.

ඔබ වයස අවුරුදු 60 ට අඩුනම් සහ ඔබට යම්කිසි රෝගී තත්වයක් ඇතිනම් හෝ කිසියම් බෙහෙතක් ලබා ගන්නේ නම්, ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන්නා හට ඒ බව දැනුම් දෙන්න. පහත කරුණු සම්බන්ධයෙන් විශේෂයෙන් දැනුම් දෙන්න:

- කෝවිඩ්-19 එන්නතහි කලින් ලබාදුන් මාත්‍රාවකට හෝ එන්නතෙහි අඩංගු දෙයකට දරුණු අසාත්මික ප්‍රතිචාරයක් ඇතිවුණි නම්
- වෙනත් එන්නත් හෝ වෙනත් බෙහෙත්වලට ඇනෆිලැක්සිස් ඇතිවුණි නම් (දරුණු අසාත්මික ප්‍රතිචාරයක්)
- කෝවිඩ්-19 එන්නතෙහි කලින් මාත්‍රාවකට පසු දරුණු අහිතකර ප්‍රතිඵල
- ප්‍රතිකාර අවශ්‍ය වන නැවත නැවත ඇතිවන ඇනෆිලැක්සිස් සමඟ සනාථවුණු මැස්ටොසයෝටිස් සම්බන්ධ ඉතිහාසයක්
- කිසි දිනෙක කැපිලරි ලීක් සින්ඩ්‍රෝමය ඇති බවට හඳුනා ගෙන තිබීම
- කලින් ලබාගත් කෝවිඩ්-19 එන්නත් මාත්‍රාවකට පසු හඳුනාගත් ත්‍රොම්බොසයිටොපීනියා සින්ඩ්‍රෝමය (TTS) ඇතුළුව කිසියම් දිනෙක මේජර් වේනස් සහ/හෝ ආර්ටීරියල් ත්‍රොම්බෝසිස් සමඟ ත්‍රොම්බොසයිටොපීනියා තිබීම
- ඔබට හෙපරින් මගින් උත්තේජනය වන ත්‍රොම්බොසයිටොපීනියා (heparin induced thrombocytopenia (HIT)), සෙන්ට්‍රල් වේනස් සයිනස් ත්‍රොම්බෝසිස් (central venous sinus thrombosis (CVST)), උදර වාහිණීවල ලේ කැටිති (ස්ප්ලැන්ච්නික් වේනස්) හෝ ලේ කැටි ගැසීම් සමඟ එක්වුණු ඇන්ටිෆොස්ෆොලිපිඩ් සින්ඩ්‍රෝමය සම්බන්ධ ඉතිහාසයක් ඇතිනම්

- මයෝකාඩිටිස් සහ/හෝ පෙරිකාඩිටිස් කිසිදාක තිබීම
- කලින් හෝ දැනට ඇකියුට් රූමටික් ෆීවර් හෝ එන්ඩොකාඩිටයිස් තිබීම
- කොන්ජෙනිටල් හාට් ඩිසීස් තිබීම
- ඩයල්ටඩ් කඩියෝමයෝපති (වයස අවුරුදු 30 ට අඩු අය) තිබීම
- දරුණු ලෙස හෘදය වස්තුව අසමත්වීම
- හෘදය වස්තුව බද්ධ කල අයෙකු
- රුධිර වහණ රෝගයක් ඇතිනම් හෝ රුධිරය කැටි ගැසීමට එරෙහි ප්‍රතිකර්ම (රුධිර තුනීකරන) ලබා ගනී නම්
- ගර්භනීනම්
- ප්‍රතිශක්තිය හීනවී ඇතිනම් (උදා. දුර්වලවූ ප්‍රතිශක්තිකරණ පද්ධතියක් ඇතිනම් හෝ ප්‍රතිශක්තිය හීන කරන බෙහෙත් ලබා ගනී නම්)
- කලින් කෝවිඩ්-19 ආසාදනයවී ඇතිනම්, හෝ කෝවිඩ්-19 හේතුවෙන් දිගින් දිගට පවතින අසනීප ඇතිනම්
- වෙනත් කෝවිඩ්-19 එන්නතක් ලබා ගෙන ඇතිනම් (කුමන වර්ගයද යන්න සමඟිනි)
- පසුගිය දින 7 ඇතුලත වෙනත් කිසියම් එන්නතක් ලබා ඇතිනම්

සමහර අවස්ථාවල, එන්නතක් ලබා ගැනීමට දිනයක් පිළියෙල කර ගැනීමට පෙර ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන්නා සමඟ සාකච්ඡාවක් තිබීම බඩා යෝග්‍යවේ. ඔබට ලැබෙන විශේෂිත එන්නත සම්බන්ධ තොරතුරු කියවිය හැක:

- කෝවිඩ්-19 ෆයිසර් (කොමිනාර්ටි) එන්නත සම්බන්ධ තොරතුරු, හෝ
- කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නත සම්බන්ධ තොරතුරු

## ඔබට එන්නත ලබාදෙන ආකාරය

ඔබට එන්නත ලබා දෙන්නේ එන්නතක් වශයෙන්, බොහෝ අවස්ථාවල ඔබගේ අතෙහි ඉහළ මාංශ පේශිවලටය. එන්නත ලබාදීමෙන් පසු අවම වශයෙන් මිනිත්තු 15 ක් නිරීක්ෂණය සඳහා එන්නත් සායනයේ රැඳී සිටිය යුතුය. ඔබගේ රෝග ඉතිහාසය අනුව, සායනය තුල මිනිත්තු 30 ක් රැඳී සිටින ලෙස ඉල්ලා සිටිය හැකිය.

## හමුවීමේදී ඔබ ලබා දෙන තොරතුරු උපයෝගී කර ගන්නා ආකාරය

ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කරන, තැන්පත් කර තබන සහ භාවිතා කරන ආකරය සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා https://www.health.gov.au/using-our-websites/privacy/privacy-notice-for-covid-19-vaccinations වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.